Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල**

සතිය - 16

විෂයය:- කෘෂි හා ආහාර තාක්ෂණය

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

"අතීතයේ සත්ව පාලන කටයුතු පිළිබඳ සොයා බලන විට එම කටයුතු ඉතා සරල අන්දමින් සිදු කළ ආකාරය ඔබට පෙනීයනු ඇත. නමුත් වර්තමානයේ සියලු දේ බෙහෙවින් සංකීර්ණය වී ඇති බවත් එ්වායේ වෙනස දකින්න උත්සාහයක නිරතවන්න."

1) ගොවිපොල සතුන් අතර ගවයින් ඇතිකරනු ලබන ප්‍රධාන ක්‍රම 3 ක් ඔබ ඉහතින් හඳුනාගෙන ඇත.

1 නිදැලි ක්‍රමය

2 අඩ සියුම් ක්‍රමය

3 සියුම් ක්‍රමය

එම ක්‍රම වල දක්නට ලැබෙන වාසි අවාසි පෙළ ගස්වන්න.

2) ලංකාවේ වියළි කලාපයේ නිදැලි ක්‍රමයට ගවයින් ඇති කරනු ලබයි. විමසීමක් කරන්න.

8.4.2. ගව නිවාස.

"පරිසර තත්තව හිතකර ලෙස පාලනය කිරීමෙන් සතුන් ගේ නිශ්පාදන ශක්තිය වැඩිකර ගතහැකිය. පරිසර තත්තව පාලනයෙහිලා ගවයින්ට නිවාස සැපයීම ඉතා වැදගත් ස්ථානයක් ගනී."

1) ගවයින්ට නිවාස සැපයීමේ අරමුණු පෙළ ගස්වන්න.

2) ගව නිවාසයක තිබිය යුතු අවශ්‍යතා මොනවාද?

3) ගව නිවසක් ඉදිකිරීමේදි සැලකිය යුතු කරුණු 5ක් ලියන්න.(ගව නිවාස වලට ඉතා හොඳින් සූර්යාලොෝකය අවශ්‍ය වේ.(අධික උණුසුම අහිතකරයි.) එබැවින් බොහොෝවිට ගව නිවාස ඉදිකරනු ලබන්නේ ඊසාන - නිරිත දිසානුගතවයි.

සතුන්ගේ විවිධ වයස් මට්ටම් අනුව ඔවුන්ට ලබාදිය යුතු ඉඩ ප්‍රමාණයන් එකිනෙකට වෙනස් වේ. ගව නිවාස වල වෙනස් කම් අධ්‍යයනය කොට පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1) එක් කිරි ගවයකු සඳහා අවශ්‍යය ඉඩ පමාණය කොපමණද? (මීටර්)

2) එක් පැටවකු සඳහා ඉඩ ( මීටර්)

3) ගර්භණී සතෙකුට ගව නිවාසයක ඉඩ ලබා දිය යුත්තේ කෙසේද?

සියුම් හා අඩසියුම් ක්‍රමවලදී කිරි ගවයින්ගේ නිවාස ප්‍රධාන ආකාර දෙකකට අනුව භාවිතා කරයි.

1 සතුන් බැඳ තබන නිවාස

2 නිදහස් ක්‍රමය

* එම ක්‍රම හොදින් අධයනය කොට දක්නට ලැබෙන විශේෂතා පිළිබඳ කෙටි සටහන් ලියන්න

.

(වැඩි දුරටත් රූප සටහන් සඳහා පෙර පරිදි අන්තර්ජාලය භාවිතා කරන්න)